කවරයේ කතාව

# තේ කර්මාන්තයේ අයිතීන් සුරකින කොළඹ තේ වෙළෙඳුන් ගේ සංගමය

**තේ ශ්‍රී ලංකාවේ අපට නැතිවම බැරි පානයකි. වෙහෙස නිවා ගැනීමට, ඒසේත් නැතිනම් කාන්සිය දුරුකර ගැනීමට, තේ පානය කිරීම අපි පුරුද්දක් කර ගෙන සිටිමු. මෙසේ, දිනකට අපි තේ කෝප්ප 2 ත්, 3 ත් අතර ප්‍රමාණයක් පානය කරමු. එමනිසා ශ්‍රී ලංකාවේ තේ පරිභෝජනය ඉහළ අගයක් ගනී. ලොව හොඳම තේ නිෂ්පාදකයා ද අපමය. ශ්‍රී ලංකා තේ සඳහා විදේශ වෙළෙඳ පොළේ ඇති කීර්ති නාමය නිසාම, අදත් කෘෂි අපනයන අතරින් ශ්‍රී ලංකාවට ඉහළම ආදායමක් ලබා දෙයි.**

නමුත් කුඩා වෙළෙඳුන් නිසා, අද අප රටේ අපනයන තේ වෙළෙඳුන්ටත් දේශීය තේ වෙළෙඳුන්ටත් විශාල අපකීර්තියක් අත් වී තිබේ. මේ පිළිබඳ සොයා බැලීමට තේ වෙළෙඳුන් ගේ සංගමයේ සභාපති ටසබ් අක්බර් අලී මහතා හමු වීමු.

*** තේ වෙළෙඳුන් ගේ සංගමය සැදී ඇත්තේ කෙසේ ද? එහි කාර්යභාරය කුමක් ද?**

කොළඹ තේ වෙළෙඳුන් ගේ සංගමය තේ ව්‍යාපාරයට අදාළ හැම අංශයකට ම අයත් එනම්, තේ අපනයනකරුවන් ගේ, තේ නිෂ්පාදකයන්ගේ තේ කුඩා ව්‍යාපාරිකයන් ගේ සහ තේ තැරැව්කරුවන් ගේ සංයෝගයෙන් සමන්විත පෞද්ගලික අංශයේ සංවිධානයකි.

මෙම සංගමයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ තේ කර්මාන්තය සෑම අංශයකින්ම සංවර්ධනය කිරීමත් තේ කර්මාන්තයට සම්බන්ධ සියලු ම අංශවල අයිතීන් ආරක්ෂා කරදීමත් ය.

මෙම සංගමය සතිපතා කොළඹ තේ වෙන්දේසිය පවත්වනු ලබන අතර මෙය ලෝකයේ විශාලතම තේ වෙන්දේසි මධ්‍යස්ථානය වේ.

***තේ මිල ක්‍රමවත්ව පවත්වා ගත හැකි ජාත්‍යන්තර සංවිධානයක් පිහිටුවා ගත නොහැකිද? එවැනි සංවිධානයක් පිහිටුවීමට උත්සාහ දරා තිබේද?**

තේ සඳහා පිහිටුවා ඇති ඔපෙක් සංවිධානය මෙන් තේ මිල ක්‍රමවත් බවට පත් කළ හැකි ජාත්‍යන්තර සංවිධානයක් පිහිටුවා නැත. අතීතයේ දී එවැනි සංවිධානයක් පිහිටුවා ගැනීමට උත්සාහ දරා ඇතත් එය සාර්ථක ;නාවූයේ තේ නිපදවන රටවල් අතර එකඟත්වයක් නොවූ බැවිනි. ඒ හැරුණුවිට විවිධ රටවල්වල විවිධ තේ නිෂ්පාදනය කෙරේ. එබැවින් තේ සඳහා ඒකාකාරී මිලක් නියම කිරීම දුෂ්කරය.

*** අපට, තේ මිලක් නියම කළ නොහැකි ද?**

අපට තේ සඳහා මිලක් නියම කළ නොහැකිය. තේ මිල පාලනය කරනු ලබන්නේ වෙළෙඳපොළ වටිනාකමට අනුව ඉල්ලුම හා සැපයුම මතය.

*** ශ්‍රී ලංකා තේ සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබා තිබේද? දේශගුණය අනුව, කලාප අනුව තේවල ගතිගුණ වෙනස් වෙනවා. එමනිසා ලංකාවට අයත් තේවලට නීත්‍යානුකූල අයිතියක් ගත හැකි ද?**


ශ්‍රී ලංකා තේවල මුල් ම නීත්‍යානුකූල අයිතිය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ක්‍රියා මාර්ගයන් ආරම්භ කර ඇත. එවැනි මූලික නීත්‍යානුකූලභාවයක් ඇති කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් ආරක්ෂිත ක්‍රියා මාර්ගයක් ගැනීමට තව බොහෝ කල් ගත වනු ඇත.

*** ශ්‍රී ලංකා තේ ජනප්‍රිය කරවීම සඳහා තේ මණ්ඩලය සමග එක්ව, ඔබ ආයතනය ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද? ඒ පිළිබඳ ඔබ සෑහීමට පත් වෙනවාද?**

ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ශ්‍රී ලංකා තේ ජනප්‍රිය කරවීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය ක්‍රියා මාර්ග කිහිපයක් ගෙන ඇත. ශ්‍රී ලංකා තේවලට අදාළ වන අතිවිශිෂ්ට ගුණය ප්‍රචලිත කිරීම ජාතීන් අතර තේ ප්‍රවර්ධනය කිරීමේ තේමාව වේ. වෙළෙඳ නාම ප්‍රවර්ධනයේ මූලික අරමුණ වන්නේ නැවුම් ශ්‍රී ලංකා තේවල වෙළෙඳ නාමය හා සිංහල ලාංඡනය ජාත්‍යන්තර වෙළෙඳ පොළේ ප්‍රචලිත කිරීමයි.

තේ මණ්ඩලයට ලබා දී තිබෙන සීමිත මූල්‍ය සම්පත් උපයෝගී කරගෙන තේ මණ්ඩලය ශ්‍රී ලංකා තේ ජනප්‍රිය කරවීම සඳහා ගන්නා උත්සාහයන් ගැන අපි සෑහීමකට පත්වෙමු.

*** ශ්‍රී ලංකා තේ, පිටරටවල දී අපවිත්‍ර තේ සමග මිශ්‍රකර අලෙවි කිරීමෙන් ලාබ ලබන අවස්ථා වාර්තා වනවා. එමඟින් ලංකා තේවලට අපකීර්තියක් අත්වෙනවා. ඒ පිළිබඳ ඔබ සංගමයේ අදහස?**



තේ වෙළෙඳුන් ගේ සංගමයේ සභාපති ටයබ් අක්බර් අලී

පිටරට තේ, ශ්‍රී ලංකාවේ වෙළෙඳනාමයෙන් පිටරටවල දී විකුණන අවස්ථාවල දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය එයට විරුද්ධව ක්‍රියා කරනු ලැබේ.

*** මෙවැනි වංචාසහගත කටයුතු වැළැක්වීමට ඔබ සංගමය ගෙන ඇති පියවර?**

මෙම බාල වර්ගයේ තේ මිශ්‍රකිරීමේ උවදුර රහසිගතව ක්‍රියාත්මක කරනු ලබන්නේ ජාවාරම්කරුවන් අතලොස්සක් විසිනි. මෙම අයථා ක්‍රියා මැඩ පැවැත්වීම සඳහා තේ මණ්ඩලය සහ කොළඹ තේ වෙළෙඳුන් ගේ සංගමය නිරන්තර පරීක්ෂාවෙන් සිටී. එම පාලනයන් නිසියාකාරව නදින් ක්‍රියාත්මක වන අතර බාල වර්ගයේ මිශ්‍ර කළ තේ ජාත්‍යන්තර වෙළෙඳ පොළ වෙත කෙලෙසකවත් ඉදිරිපත් කළ නොහැකිය.

*** ඔබ ආයතනයට, ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් ලැබෙන සහයෝගය පිළිබඳ සඳහන් කළොත්?**

ශ්‍රී ලංකා තේ ලොව වටා ජනප්‍රිය කරවීම සඳහා කොළඹ තේ වෙළෙඳුන් ගේ සංගමය ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග සහයෝගීතාවෙන් යුතුව කටයුතු කරනු ලබයි. අනෙකුත් වෙන්දේසි මධ්‍යස්ථාන හා සැසඳීමේ දී කොළඹ තේ වෙන්දේසියේ දී උපරිම මිලකට තේ අලෙවිවීම මෙම ශ්‍රී ලංකා තේ ජනප්‍රිය කරවීම සඳහා ගෙනයන ව්‍යාපාරයේ සාර්ථකත්වයට පැහැදිලි නිදසුනකි.

❑

**ඉන්දික**